**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2018**
---------------------------------------------------

## 1.1 මතය

--------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම් වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් " මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 65 වන ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කල යුතු වුවද විශ්වවිද්‍යාලය සතුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 45.10 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කල වත්කම් සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කළ සියළුම වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව අදාල කමිටු වලට ඉදිරිපත් කර ඒවායේ ජීව කාලය වාර්ෂිකව විමර්ෂණය කළ අතර ඇස්තමේන්තුවල වෙනසක් ඇත්නම් එම දෝෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 අනුව ප්‍රතිශෝධනය කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුවීම. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාල අරමුදලින් මිලදී ගෙන තිබූ වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,831,091ක් ක්‍රමක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමකින් අධිගණනය වී තිබුණි. | විශ්වවිද්‍යාලයේ අරමුදලින් මිලදී ගෙන ඇති ස්ථාවර වත්කම් සඳහා ද ක්‍රමක්ෂය කරනු ලැබුවේ එමගින් වර්ෂයේ අතිරික්තයට හෝ ඌනතාවයට බලපෑමක් වීමෙන් ඇති වන වැරදි ප්‍රතිරූපය වළක්වාලීමේ අරමුණෙනි. මෙම ගණකාධිකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරෙනුයේ පාලක මණ්ඩල අනුමැතිය සහිතවය. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |

## 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බාහිර කථිකාචාර්යවරුන්ට ගාස්තු හා ගමන් වියදම් වෙනුවෙන් නිකුත් කරන ලද 2015 ජනවාරි 22 දිනැති අංක.1/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය පදනම් කරගනිමින් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර දේශකයන් සඳහා සතිඅන්තයේ ඉටු කරන රාජකාරී වෙනුවෙන් 2018 වර්ෂයට අදාලව කථිකාචාර්යවරුන් 39 දෙනෙකු වෙනුවෙන් විධිමත් අනුමැතියකින් තොරව රු.335,200ක මුදලක් ගෙවා තිබුණි. | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් මෙම ගෙවීම් සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වා ඇත. ඒ අනුව 2019 අප්‍රේල් 30 දින අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපියක් කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර මේ දක්වා පිළිතුරු ලැබී නොමැත.. | අදාල පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කලයුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වගකීම් කාලය ඉකුත් වී තිබූ එකතුව රු.17,504,991 ක්වූ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු. මිලියන 17.5 මුදල තැන්පත් නොවන අතර සැපයුම්කරුවන්ගෙන් රඳවා ගැනීම් වේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 මාර්තු 14 දිනැති අංක 3(01) දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කාර්යාල චක්‍රලේඛය | කාර්යාල නිලධාරීන් සඳහා වසර 05ක කාල සීමාවක් සඳහා පමණක් නිල නිවාස ලබාදිය යුතු වුවත් ඊට පටහැනිව නිලධාරීන් 02 දෙනෙකු වෙත නිල නිවාස ලබාදී තිබුණි. | මේ වන විට එක් නිලධාරියෙකුට විශ්වවිද්‍යාල නිවාසයෙන් ඉවත් විය යුතු බවට දැනුම් දී ඇත. | කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXX පරිච්ඡේදයේ 1.3 හා 1.4.1 ඡේද | රජයේ නිලධාරියෙකු නිත්‍ය රැකියාවට හෝ ධුරයට පරිබාහිරව සේවාවන් ඉටුකිරීමේදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඊට පටහැනිව කිසිදු අනුමැතියකින් තොරව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ස්ථිර පත්වීම් ලැබූ අභ්‍යන්තර කථිකාචාර්යවරුන් තුන් දෙනෙකු සතියේ දිනයන්හි රාජකාරී වේලාවන් තුල හා ඉන් බැහැරව රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ දේශන පවත්වා තිබුණි. | මෙම විගණන විමසුමෙහි සඳහන් කරුණු තහවුරු කිරීම සඳහා විධිමත් විනය පරීක්ෂණයක් වෙත ඉදිරිපත් කිරීම පහසු කර ගැනීම සඳහා මූලික විමර්ශනයක් පැවැත්වීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 ජුලි 15 දිනැති අංක 2015/2 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2018 මාර්තු 18 දිනැති අංක 2018/01 වත්කම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයට අයත් 1995 ලියාපදිංචි කරන ලද භාවිතයෙන් ඉවත් කර ඇති මෝටර් රථය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි . | මෝටර් රථයේ ලියාපදිංචිය අවලංගු කිරීමට අදාල ලිපි ලේඛන මේ වනවිට භාරදී ඇති අතර එම කාර්ය නිම වූ පසු මෙම මෝටර් රථය සිසුන්ගේ ව්‍යාපෘති හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ලබාදීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,632,874 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,825,746 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,458,620 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු මෙහෙයුම් වියදම් රු.40,584,009 කින් වර්ධනය වී තිබුණද පුනරාවර්තන ප්‍රදාන, අනෙකුත් ආදායම්, උපාධි පාඨමාලා ආදායම් හා විලම්භිත ආදායම් රු. 50,422,883 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන විභාගයන්හි ප්‍රතිඵල මාස 03ක් ඇතුළත නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල පැවැත්වූ විභාග වලින් විගණිත දිනය වූ 2018 නොවැම්බර් 05 වන විට මාස 03 ඉක්මවා තිබුණද ප්‍රතිඵල නිකුත් කිරීමට නොහැකි වූ පාඨමාලා 07 ක් පැවතුණි. | අදාල ප්‍රතිඵල මාස 03ක් ඇතුලත නිකුත් කිරීමට නොහැකි වුවත් පසුගිය වසර වල ප්‍රතිඵල නිකුත් කිරීම් හා සැසඳීමේදී මේ වන විට සියලු ප්‍රතිඵල මාස 03ක් ඇතුලත අධ්‍යයන අංශය මගින් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. එය පීඨ මණ්ඩලය මගින් අධීක්ෂණය වේ. | ප්‍රමාදයකින් තොරව ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කල යුතුවීම. |
| (ආ) විභාගය පවත්වා සති 06ක් ඇතුලත පැවැත්වූ විභාගයන්හි උත්තර පත්‍ර පරීක්ෂා කර ලකුණු ලබා දිය යුතුව තිබුණද පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම | අදාල ප්‍රතිඵල මාස 03ක් ඇතුලත නිකුත් කිරීමට නොහැකි වුවත් පසුගිය වසර වල ප්‍රතිඵල නිකුත් කිරීම් හා සැසඳීමේදී මේ වන විට | ප්‍රමාදයකින් තොරව ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පිළිතුරු පත්‍ර පරීක්ෂාව නිසි |

| | | |
|---|---|---|
| සඳහා භාර ගැනීමට මාස 01 සිට මාස 06 දක්වා වූ කාලයක් ගතවී තිබූ අතර පරීක්ෂා කර නැවත ඉදිරිපත් කිරීමට මාස 02 සිට මාස 07 කට වඩා වැඩි කාලයක් ගත කර තිබුණු බව නිරික්ෂණය විය | සියලු ප්‍රතිඵල මාස 03ක් ඇතුලත අධ්‍යයන අංශය මගින් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. එය පීය මණ්ඩලය මගින් අධීක්ෂණය වේ. | කාලසීමා තුළ ඉටු කල යුතුවීම. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------------------ | ----------- |
| විශ්වවිද්‍යාලයෙන් ඉටුකල යුතු සමාජ වගකීම් නිශ්චිතව හදුනානොගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු.291,969 ක වියදමක් සමාජ වගකීම් යටතේ වැය කර තිබුණි. | අදාල වියදම් විශ්ව විද්‍යාලයීය ඉපයීම් (රු.මිලියන 36.5) උපයෝජනය කරමින් දරා ඇති අතර විශ්ව විද්‍යාලයීය සේවක සුභ සාධනය සඳහා වෙනත් වැය ශීර්ෂයක් නොමැත. | අයවැයගත ප්‍රතිපාදන මඟින් වියදම් දැරීම සඳහා අනුමැතිය ලබාගත යුතුවීම. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------------------ | ---------- |
| 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන චක්‍රලේඛයේ උපදෙස් පරිදි රාජ්‍ය අංශයේ උත්සව, සම්මන්ත්‍රණ වැඩමුළු හා අනෙකුත් එවැනි වැඩසටහන් අවම පිරිවැයක් යටතේ ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකි වන අයුරින් සංවිධානය කිරීමට වගබලා ගත යුතු බවට දක්වා තිබුණද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී ධාරිතා සංවර්ධන වැඩසටහනක් කොළඹින් පිට හෝටලයක පැවැත්වීම වෙනුවෙන් දින දෙකක් සඳහා නිලධාරින් 50 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 02 ක මුදලක් වැය කර තිබුණි. | පරිපාලන කටයුතු පිලිබඳ දැනුම ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන පවත්වන ලද අතර මිලෝදා ආයතනය භාණ්ඩාගාරයට අනුයුක්ත ආයතනයක් බැවින් තරඟකාරී මිල ගණන් කැඳවීමක් සිදු නොකරන ලදි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කාර්යමණ්ඩලය 2012 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමේදී සුදුසුකම් සපුරා නොතිබූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු සඳහා දරන්නාට පෞද්ගලික වන සේ සුදුසුකම් සපුරා ගැනීමට යටත්ව තනතුරුවල පිහිටුවා තිබුණද එම නිලධාරීන්ගෙන් 06 දෙනෙකු 2019 මැයි 31 දක්වාම අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ගෙන නොතිබුණි. | දෙදෙනෙක් මේ වන විටත් නියමිත සුදුසුකම් සපුරා විධිමත්ව අදාල තනතුරට අන්තර්ග්‍රහනය වී ඇත. අනෙක් නිලධාරීන් සම්බන්ධයෙන්ද අදාල පියවර සඳහා යොමු වීමට කටයුතු කරමින් සිටී. | සුදුසුකම් සම්පූර්ණ කරගත යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාල පනතේ 31(2) ඡේදය ප්‍රකාරව අනධ්‍යයන තනතුරකට කරනු ලබන සෑම පත්වීමක්ම අවුරුදු 03ක පරිවාස කාලසීමාවක් සඳහා විය යුතු අතර එම පත්වීම ස්ථිර කිරීම සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුව වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කළමනාකරණය කටයුතු කලයුතුය. එහෙත් වර්ෂ 03 ඉක්මවා සේවය ස්ථිර කිරීමෙන් තොරව සේවයේ යෙදී සිටින අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 10දෙනෙකු මෙතෙක් සේවය ස්ථිර කිරීම සඳහා වූ සුදුසුකම් සපුරා නොතිබුණි. | එසේම ඉදිරියේදී සෑම වසරකටම වරක් මෙම කාර්යක්ෂමතා විභාග විධිමත්ව පැවැත්වීමට කටයුතු කරනු ඇත. | බඳවාගැනීමේ පටිපාටිය අනුව උචිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතුය. |